**ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව**

---

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන**,** වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්**,** ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර**,** මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

  මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග සැසඳීමක් කළ නොහැකි වූ අතර ඒ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නොමැත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් සංචලන පිළිබඳ වාර්තාවේ ශේෂය හා 2018 ජනවාරි 01 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් ශේෂය අතර රු. 13,391,777 ක වෙනසක් නිරීක්ෂණය වූ නමුත් එම ශේෂයන් අතර වෙනසට හේතු හඳුනා ගෙන සැසඳීමට කටයුතු කර නොතිබුණි. | ඒ ඒ වත්කම්හි ඉදිරියට ගෙන ආ වටිනාකම්වල වෙනස හඳුනාගෙන එම වෙනසට හේතු ඉදිරිපත් කර සැසඳීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදිය. 2017 දෙසැම්බර් මස 31 දිනට ජංගම නොවන වත්කම් අගය හා ජංගම නොවන වත්කම් හි අගයන් අතර රු. 13,391,777 ක වෙනසක් පැවති අතර, එම වෙනස නිවැරදි කර 2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්හි අගය වාර්තා කර ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට රු. 29,680,827 ක් ලෙස වාර්තා කර ඇති ස්ථාවර වත්කම්, නව සිගාස් වැඩසටහන හරහා මහා භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණි. | ස්ථාවර වත්කම් අදාල අවස්ථාවේදී ම සිගාස් වැඩසටහන යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | කර ඇත. |

**1.6.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් වටිනාකම හා උපලේඛණ වල සඳහන් වටිනාකම් අතර රු.9,133 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු පරීක්ෂා වී නොතිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන සැසඳීම් කිරීමට කටයුතු කළ යුතු වීම. | නිවැරදිය. ලිපිකාරමය දෝෂයක් හේතුවෙන් රු. 9,133/- ක මුදල මග හැරී ඇත. මෙම මුදල හරස් සටහන් මගින් වාර්තා කර ඇති නිසා ගිණුම් තුල ඇතුලත් වී ඇත්තේ හරස් සටහන් ලෙසය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරන ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය තුළදී රු.මිලියන 272.2 ක අග්‍රිම ඉල්ලුම් කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර රු.මිලියන 402.5 ක් ඉල්ලුම් කර තිබුණි. භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණු අග්‍රිමය රු.මිලියන 129.8 පමණක විය. ඒ අනුව දෙපාර්තමේන්තුව අවශ්‍ය අග්‍රිම මුදල නිවැරදිව සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය විය. | අග්‍රිමය නිසි පරිදි සැලසුම් කිරීමත්,අග්‍රිම කළමනාකරණය ඵලදායි ලෙස සිදු කිරීමටත් කටයුතු කිරිම | අදහස් දක්වා නොමැත. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය පිළිවෙලින් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 89 ක් හා 50 ක් විය. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු හැකිතාක් තාත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | නිවැරදිය. |
| (ආ) | වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු වැයවිෂයක් සඳහා මු.රෙ. 66 මඟින් රු.මිලියන 3.08 ක් මාරු කර තිබුණු අතර ඉන් සියයට 97ක් ඉතිරි වී තිබුණි. | මු.රෙ මාරුකිරීම් අවශ්‍යතාවය මත පමණක් කළ යුතු වීම. | නව වැටුප් මෘදුකාංගය සඳහා ICT ආයතනය වෙත ගෙවීම සඳහා රු. 30,85,000 ක මුදලක් මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන සලසාගත් නමුත් එම වැටුප් මෘදුකාංග පද්ධතියේ පැවති තාක්ෂණික දෝෂ හේතුවෙන් එම මුදල 2018 වර්ෂයේ නිදහස් නොකරන ලදී. |
| (ඇ) | වැය විෂයයන් 09 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන් | වාර්ෂික අයවැය ඇස්තමේන්තු | නිවැරදිය. |

| | |
|---|---|
| කරන ලද ප්‍රතිපාදන මු.රෙ. 66 – 69යටතේ සියයට 05 සිට 100 දක්වා අඩු කිරීමටද, වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සියයට 06 සිට සියයට 74 දක්වා වැඩිකිරීමටද කටයුතු කර තිබුණි. | හැකිතාක් තාත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94 (i) අනුව බැඳීම ඇති කර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගත යුතු වුවද , එවැනි තහවුරු කර ගැනීමකින් තොරව එක් වැය විෂයයක් වෙනුවෙන් බැඳීම් ඇතිකර ගැනීම හේතුවෙන් රු. 21,724 කින් ප්‍රතිපාදන ඉක්මවා වැය කර තිබුණි. | බැරකම් සඳහා බැඳීම් සිදුකිරීමේ දී අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කිරීම | නිවැරදිය. 2018 දෙසැම්බර් මාසයේ අපේක්ෂා කල ප්‍රමාණයට වඩා අතිකාල ගෙවීම් සිදු කර තිබීම හේතුවෙන් අපේක්ෂිත වියදම් සීමාව ඉක්මවා ඇත |

**2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) අ පරිදි ගණන්දීමේ නිලධාරී විසින් මූල්‍ය සැලසුම් කරණය හා මූල්‍ය කළමණාකරනය නිසි පරිදි සිදු කල යුතු වුවත් ඉහත 2.1,2.2 හා 2.3 හි පිළිවෙලින් සඳහන් වන අග්‍රිම කළමණාකරණය, වියදම් කලමණාකරණය හා බැරකම් හා බැඳීම් වලට එළඹීමේ දුර්වලතා හේතුවෙන් පනතෙහි විධිවිධාන වලට අනුව ගණන්දීමේ නිලධාරී විසින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නිවැරදිය. නියමිත අග්‍රිම සීමාව තුල කටයුතු කර ඇති අතර,ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් සුචිවයන් 32 ක් මිලදී ගැනීමට නොහැකි වීමත්,මෘදුකාංග හා සංවර්ධන වැයවිෂයය යටතේ මු.රෙ 66 ට අනුව ප්‍රතිපාදන මාරුකර ගැනීම ආදි හේතුන් නිසා ප්‍රතිපාදන ඉතිරි විම. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 හා 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.5 ඡේදය | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ හා යෝජනා සම්බන්ධයෙන් 2019 මැයි 05 දින වන විටත් අදාළ කටයුතු අවසන් කර නොතිබුණි. | භාණ්ඩ ඉවත්කිරීමේ කටයුතු අදාල චක්‍රලේඛ ප්‍රකාරව සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. | නිවැරදිය. මුදල් අමාත්‍යාංශයේ පවතින මාධ්‍ය උපකරණ පිළිබඳව නිසි අවබෝධයක් හා තාක්ෂණික හැකියාවක් ඇති නිලධාරීන් හිඟවීම හේතුවෙන් මේ සඳහා යම් කාල පමාවක් සිදුව ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 15 ක් සමග පිළියෙල කර ඉදිරිපත් කර තිබුණ ද එම සැලැස්ම සමග සංවිධාන ව්‍යුහය, කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | 2019 වාර්ෂික සැලැස්ම සකස් කිරීමේ දී එවැනි අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය මඟින් වැඩිදියුණු කළ තොරතුරු තාක්ෂණ කළමණාකරන තොරතුරු පද්ධති (ITMIS) පරිගණක මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2018 දෙසැම්බර් 31 වන විට සිදු කිරීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද එය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බව වාර්ෂික කාර්යසාධන වාර්තාව පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සැලසුම් කරන ලද අරමුණු ඵලදායී ලෙස ළඟා කරගැනීම සඳහා පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළයුතු වීම. | ITMIS පද්ධතියේ අයවැය සැලසුම්, අයවැය විසර්ජන සහ පද්ධති පරිපාලන මොඩියුලයන් 2018 වර්ෂයේ ක්‍රියාත්මක විය. අනෙකුත් මොඩියුලයන්ද 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට තිබූ නමුදු විවිධ හේතූන් නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සංසන්දනාත්මකව පරීක්ෂා කළ හැකි ලෙස වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කළ යුතු වුවත් එලෙස සංසන්දනය කල හැකි ආකාරයට කාර්යය සාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි . | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සංසන්දනාත්මකව පරීක්ෂා කළ හැකි ලෙස වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කළ යුතු වීම | ඇතැම් විට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ වැඩ කොටස්ද කාලීන අවශ්‍යතාවය පරිදි මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරයි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සමඟ සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම තරමක් අපහසු වුවද ඉදිරියේදී නිසි අයුරින් පිළියෙල කිරීමට බලාපොරොත්තු වේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවේ දර්ශක පදනම් කර ඉහත කී අරමුණු හා දර්ශක හඳුනා ගැනීම හා ළඟා කර ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු විය. එහෙත් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුළු සැලසුම් නියමිත පරිදි සකස් වී නොතිබුණු අතර 2019 වර්ෂය වන විටද එම අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි. | ළගා කර ගත හැකි තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවදානය යොමු කරමින් එම අරමුණු කඩිනමින් ඉටුකර ගැනීමට අවශ්‍ය සියළු කාර්යයන් කළ යුතු වීම. | තිරසාර සංවර්ධන අරමුණු අතරින් 8 වන සහ 9 වන අරමුණු ළඟා කර ගැනීමේ අරමුණින් 2018 වසරේ මෙන්ම 2019 වසරේද ක්‍රියාකාරී සැලැස්ම සකස් වී ඇත.<br><br>8 වන අරමුණ වන සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය යටතේ අර්ථ ගැන්විය හැකි දැනට ගොඩ නැගෙමින් පවතින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සැකසීම කෙරෙහි අවධානය යොමු කර ඇත. 2019 වසරේ ජුලි මස පළමුවන දින සිට මාස 18 ක කාලසීමාවක් ඇතුළත මුළු දිවයිනම ආවරණය වන පරිදි ITMIS පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.<br>9 වන අරමුණ වන කාර්මික ප්‍රවර්ධනය ඇති කිරීම අරමුණු කර ගනිමින් Digital Transformation ක්‍රියාවලිය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ගොඩනැංවීම යටතේ නව පරිගණක පද්ධතිය හඳුන්වාදීම සහ අනිකුත් උපාංග ප්‍රතිස්ථාපනය කිරීම |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 16 ක් පුරප්පාඩුව පවතින අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 35 කි. මෙම පුරප්පාඩු තුල | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපාන්නේ නම් පුරප්පාඩු පිරවීමට හෝ එසේ | මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පිළිබඳව අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක් ද පවතින අතර තනතුරු අඛණ්ඩව පුරප්පාඩු වී පැවතුණි. | නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | |
| (ආ) | සහකාර අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) තනතුරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2018 නොවැම්බර් 23 දින අනුමත කර තිබූ නමුත් බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අදාල බඳවා ගැනීම සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. | බඳවා ගැනීම් පටිපාටියට අදාල මූලික කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, විද්‍යා හා තාක්ෂණ නිලධාරි තනතුර සඳහා නිලධාරියෙකු පත් කර තිබුණු නමුත් එම තනතුර අනුමත තනතුරක් නොවීය. | තනතුර විධිමත් පරිදි අනුමත කර ගැනීමට හෝ එම තනතුර අනවශ්‍ය නම් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුවීම. | එම නිලධාරිණිය සංවර්ධන උපාය මාර්ග, ජාත්‍යන්තර වෙළඳ සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ගන්නා ලෙස දන්වමින් මුදල් අමාත්‍යාංශය මගින් එම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යවන ලදී. ඒ සම්බන්ධව පිළිතුරක් ලැබී නැති අතර සිහිකැඳවීම් යැවීමට උපදෙස් ලබා දෙන ලදී |